IHRA

UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2019/2020

## (දෙවන සෙමෙස්තරය)

## (පවත්වන ලද්දේ 2022 අගෝස්තු)

## BLE 307 - අලෙවි කළමනාකරණය

අයදුම්කරුවන්ට උපදෙස්

(01) **සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතුය.**

(02) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් (04) සහ පිටු තුනකින් (03) සමන්විත වේ.

(03) කාලය පැය දෙකයි. (02)

(04) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල ඉහලින් විභාග අංකය යොදන්න.

(05) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් අපැහැදිලි නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(06) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01.

i. වර්තමාන ව්‍යාපාරික පරිසරය තුල කළමනාකරුවෙකුට අලෙවිකරණයෙහි ඇති වැදගත්කම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. පාරිභෝගික තීරණ ගැනීමේ ක්‍රියාවලිය සුදුසු උදාහරණයක් මගින් විස්තර කරන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 25)

02.

i. නව නිපැයුම් සංවර්ධනය වර්තමාන ආර්ථිකය තුල ව්‍යාපාරිකයන්ට වැදගත් වන ආකාරය පැහැදිලි කරන නව නිපැයුම් සංවර්ධන ක්‍රියාවලියේ අදියරයන් දක්වන්න.

(ලකුණු 15)

ii. අලෙවිකරුවෙකුට වෙළඳපල ඛණ්ඩනයේ වැදගත්කම දක්වා, ශ්‍රී ලංකාවේ පුවත්පත් වෙළඳපල, ඛණ්ඩනය කල හැකි ආකාරයන් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

03.

i. ශ්‍රී ලංකා ආර්ථිකයේ පවතින වර්තමාන තත්වය අනුව භාණ්ඩයක මිල උපක්‍රමය තීරණය කිරීමේදී/වෙනස් කිරීමේදී සළකා බැලිය යුතු සාධක කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 15)

ii. භාණ්ඩ නිෂ්පාදන ජීවන චක්‍රයෙහි එක් එක් අදියරයන්හිදී අලෙවි කළමනාකරුවෙකුට ගත හැකි උපායමාර්ග දක්වමින් විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

04. පහත සඳහන් සංකල්ප පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. පවුල් ජීවන චක්‍රය (Family Life Cycle)

ii. සේවා අලෙවි මිශ්‍රය (Service Marketing Mix)

iii. සත්‍ය නිෂ්පාදනය හා අතිරේඛ නිෂ්පාදනය (Actual Product and Augmented Product)

iv. වෙළඳපල ආවරණය කිරීමේ උපාය මාර්ග

v. අලෙවිකරණ පරිසරය

(ලකුණු 5 x 5 = 25)

**************

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2019/2020

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2022 ජුලි)

# BLE 308 - ශ්‍රමයේ නූතන ප්‍රවනතා

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හයකින් (06) හා පිටු හතරකින් (04) හතරකින් සමන්විතය.

(2) (අ) කොටසේ **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයිය යුතු** අතර (ආ) කොටසේ **ප්‍රශ්න දෙකකට (02)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(3) කාලය පැය දෙකයි (02).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

## (අ) කොටස

**ප්‍රශ්න අංක 01**

i. "නිවසේ සිට වැඩ කිරීම" (Work from home) යන සංකල්පය ශ්‍රී ලංකාව තුල ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී පැනනගින ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.*

(ලකුණු 10)

ii. "ශ්‍රී ලංකා කාන්තා ශ්‍රම බලකා සහභාගිත්වය" ඉහල යාම හමුවේ ශ්‍රී ලංකාව වර්තමානයේ මුහුණ දෙන ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. *

(ලකුණු 10)

iii. "ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්තිය" පහල යාම හමුවේ ශ්‍රී ලංකා රජය වර්තමානයේ මුහුණ දෙන ගැටළු දහයක් (10) සඳහන් කරන්න. එම ගැටළු නිරාකරණය කිරීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න.*

(ලකුණු 10)

**ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු සැපයීමේදී පහත ආකෘතිය භාවිත කරන්න.*

| ගැටළුව | ගැටළුව පැහැදිලි කිරීම | යෝජනාව | යෝජනාව පැහැදිලි කිරීම |
|---|---|---|---|
| | | | |

**ප්‍රශ්න අංක 02**

පහත සංකල්ප කෙටියෙන් පහදන්න

i. රැකියා ආචාරධර්ම (Work ethics)
ii. වැඩවලදී බියගැන්වීම (Workplace bullying)
iii. වැඩ නිරීක්ෂණය (Surveillance at work)
iv. චිත්තවේගීය ශ්‍රමය (Emotional Labour)
v. විවිධත්ව කළමනාකරණය (Managing Diversity)

(ලකුණු 02 x 5=10)

(මුළු ලකුණු 40)

(ආ) කොටස

ප්‍රශ්න අංක **03**

i. "ආයතනික සමාජ වගකීම (Corporate Social Responsibility) ආයතනික තිරසාර පැවැත්ම (sustainability) යන මූලධර්මය සමඟ සමීපව බැඳී පවතී". මෙම ප්‍රකාශය සමග ඔබ එකග වේද? ආයතනික සමාජ වගකීම ඉටුකිරීම තුලින් ආයතනයකට ලබාගත හැකි ප්‍රතිලාභ ඇසුරෙන් මෙම ප්‍රකාශය පහදන්න.

(ලකුණු 15)

ii. වැඩවලදී වෙනස්කම් කිරීමෙ (Discrimination at work) ප්‍රතිවිපාක කවරේද? උදාහරණ යොදා ගනිමින් පහදන්න

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

ප්‍රශ්න අංක **04**

i. "ආයතනික වැරදි ක්‍රියාවන් හෙළිදරව් කරන විස්ල්-බ්ලොවර්වරුන් (Whistle-blowers) එම වැරදි, වාර්තා කිරීමට ප්‍රථම විවිධ සාධක කෙරෙහි තම අවධානය යොමු කරයි". මෙම ප්‍රකාශය සමග ඔබ එකග වේද? පහදන්න.

(ලකුණු 15)

ii. ආයතනික නිරීක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපිත කිරීමේදී සැලකිලිමත් විය යුතු පොදු මූලධර්ම කවරේද? පහදන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

ප්‍රශ්න අංක **05**

i. හොච්ස්චයිල්ඩ (1983) විසින් හඳුනාගෙන ඇති පරිදි චිත්තවේගීය ශ්‍රමය (Emotional labour) ඉටු කිරීමෙ ආකාර දෙක ලෙස "මතුපිට ක්‍රියාකාරිත්වය" (Surface acting) සහ "ගැඹුරු ක්‍රියාකාරිත්වය" (Deep acting) දැක්විය හැක. මෙම ආකාර දෙක උදාහරණ යොදා ගනිමින් පහදන්න.

(ලකුණු 15)

ii. "නිසි ලෙස පාලනය වන සහ පූර්ණ වශයෙන් උපයෝගී කරගත් ආයතනික විවිධත්වය, ඕනෑම සංවිධානයකට වත්කමකි". මෙම ප්‍රකාශය සමග ඔබ එකගවේද? පහදන්න

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

**ප්‍රශ්න අංක 06**

i. රැකියා - ජීවිත සමබරතාවය ඇතිකිරීම සඳහා ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක නීතිමය විධිවිධාන කවරේද? උදාහරණ යොදා ගෙන පහදන්න.

(ලකුණු 15)

ii. වැඩවලදී වෙනස් කොට සැලකීම අවම කිරීමට ඔබ ඉදිරිපත් කරන උපාය මාර්ග කවරේද? උදාහරණ යොදා ගෙන පහදන්න.

(ලකුණු 15)

(මුළු ලකුණු 30)

*****

IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - III කොටස - 2019/2020

**(දෙවන සෙමෙස්තරය)**

**(පවත්වන ලද්දේ 2022 අගෝස්තු)**

# BLE 309 - ශ්‍රී ලංකාවේ ආර්ථික ප්‍රතිපත්ති හා සංවර්ධනය

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) **ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.**

(2) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(3) කාලය පැය දෙකයි (02).

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණය වී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

(6) පිළිතුරු පත්‍රයේ සියලුම පිටු අනුපිළිවෙලට අංකනය කරන්න.

01.

1.1 ශ්‍රී ලංකාවේ විදේශ විනිමය ඉල්ලුම හා සැපයුම වෙනස්වීමට බලපෑ මෑතකාලීන හේතු කවරේද?

(ලකුණු 05)

1.2 ශ්‍රී ලංකාවේ පවත්නා තත්වය අනුව විදේශ විනිමය පාලනය කිරීම කෙසේ කල යුතුද?

(ලකුණු 05)

1.3 ශ්‍රී ලංකාවේ දැනට පවත්නා තත්ත්වයට විසඳුමක් ලෙස වඩාත් සුදුසු වන්නේ පාවෙන විනිමය අනුපාත ක්‍රමයද නැතහොත් පාවෙන පාලිත විනිමය අනුපාත ක්‍රමයද? විස්තර කරන්න.

(ලකුණු 05)

1.4 මෑත කාලයේ විදේශීය මුදලට සාපේක්ෂව ශ්‍රී ලංකාවේ දේශීය මුදල අවප්‍රමාණය (De valuation) කිරීම හේතුවෙන් මෙරට ආර්ථිකයට ඇතිවූ බලපෑම විස්තර කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

02.

2.1 ශ්‍රී ලංකාව වැනි රටකට ලබාගත හැකි විදේශ ආයෝජන කුමන ආකාරයේ ඒවාද සහ එම විදේශ ආයෝජන ලබාගැනීමට හේතුවන කාරණා මොනවාද? විග්‍රහ කරන්න.

(ලකුණු 05)

2.2 ශ්‍රී ලංකාවට අවශ්‍ය කරන විදේශ ආයෝජන ලබාගැනීමට නොහැකි වූයේ කුමන කාරණාවන් නිසාදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 05)

2.3 ආර්ථික විද්‍යාඥ කේන්ස් විසින් පැහැදිලි කරන ලද ඉතුරු කිරීමට අවශ්‍ය කාරණා අට (08) විස්තර කර එම කාරණා ඉතිරිකිරීම් වැඩිකිරීම සඳහා කුමන ආකාරයෙන් ඉවහල් කරගත හැකිද?

(ලකුණු 05)

2.4 ආයෝජන සඳහා අවශ්‍ය ඉතුරුම් ශ්‍රී ලංකාව තුළින් ලබාගැනීමට නොහැකි වී ඇත්තේ මන්දැයි පැහැදැලි කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

03.

3.1 ගෝලීයකරණය ශ්‍රී ලංකාව වැනි රටවල ආර්ථිකයන්ට සිදු කරන බලපෑම පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 06)

3.2 ගෝලීයකරණයේ වාසි ශ්‍රී ලංකාවට ලබාගැනීමට හැකි වූවාද යන්න පිළිබඳව විග්‍රහ කරන්න.

(ලකුණු 06)

3.3 ආවස්ථික පිරිවැය, ශ්‍රමය විශේෂීකරණය, මහා පරිමාණ නිෂ්පාදනයේ වාසි සහ නිරපෙක්ෂතා වාසිය පිළබඳව විග්‍රහ කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

04.

4.1 ගෙවුම් ශේෂ ලේඛනයේ ජංගම ගිණුමේ කොටස් පිළිබඳව විස්තර කරන්න.

(ලකුණු 06)

4.2 ගෙවුම් ශේෂ ලේඛනයේ හිඟයක් ඇතිවිට රටකට මුහුණ දීමට සිදුවන කාරණා පිළිබඳව ශ්‍රී ලංකාවේ වර්තමාන අත්දැකීම් ආශ්‍රයෙන් විස්තර කරන්න.

(ලකුණු 07)

4.3 ගෙවුම් ශේෂයේ අතිරික්තයක් ඇතිකර ගැනීමට නම් ශ්‍රී ලංකාව විසින් අනුගමනය කළ යුතු කාරණා පිළිබඳ විග්‍රහ කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

05.

5.1 දරිද්‍රතාව යන්න විස්තර කරන්න.

(ලකුණු 05)

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක 17 හරහා දරිද්‍රතාව හා ඊට සම්බන්ධ වන කාරණා අවම කල හැක්කේ කෙසේද?

(ලකුණු 05)

5.3 දිළිඳුකම ඇතිවීමට හේතුවන කාරණා මොනවාදැයි ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් විස්තර කරන්න.

(ලකුණු 05)

5.4 ශ්‍රී ලංකාව මුහුණ දී ඇති වර්තමාන තත්ත්වය අනුව අනාගතයේදී දරිද්‍රතාව කෙසේ වෙනස්විය හැකිද යන්න විග්‍රහ කරන්න.

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

06.

6.1 ශ්‍රී ලංකාවේ මූල්‍ය ප්‍රතිපත්තිය හා බදු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම පිළිබඳව සෑහීමට පත්විය හැකිද? විග්‍රහ කරන්න.

(ලකුණු 05)

6.2 හැකිළෙන සුළු බදු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම නිසා ආර්ථිකයට වුනු බලපෑම කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 05)

6.3 ශ්‍රී ලංකාවේ උද්ධමනය පාලනය කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද?

(ලකුණු 05)

6.4 වර්තමානයේ රටතුළ පවතින උද්ධමනය නිසා මෙරට ආර්ථිකයට ඇතිවිය හැකි අවාසි මොනවාද?

(ලකුණු 05)

(මුළු ලකුණු 20)

07.

7.1 ශ්‍රී ලංකාවේ ආනයන ආදේශන ප්‍රතිපත්තියේ සාර්ථක/අසාර්ථකභාවය පිළිබඳ විස්තර කරන්න.

(ලකුණු 08)

7.2 අපනයන ප්‍රතිපත්තිය දියුණු කිරීමේ වාසිය ශ්‍රී ලංකාවට ලබාගැනීමට හැකි වූවාද? විස්තර කරන්න.

(ලකුණු 06)

7.3 ශ්‍රී ලංකාවේ අපනයන ආදායම වැඩිකර ගැනීමට හැකි දිගුකාලීන ප්‍රතිපත්ති මොනවාදැයි විස්තර කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

08.

8.1 ආර්ථික වර්ධනය යනු කුමක්ද? විස්තර කරන්න.

(ලකුණු 04)

8.2 ආර්ථික වර්ධනය මැනිය හැක්කේ කෙසේද?

(ලකුණු 04)

8.3 ආර්ථික විද්‍යාඥ ආතර් ලුවිස් (Arthur Lewis) ගේ ද්විත්ව ආර්ථික න්‍යායට අනුව ග්‍රාමීය අංශයේ හා නාගරික අංශයේ ලක්ෂණ ශ්‍රී ලංකාව ආශ්‍රයෙන් සංසන්දනය කරන්න.

(ලකුණු 05)

8.4 ආර්ථික විද්‍යාඥ ආතර් ලුවිස්ගේ ද්විත්ව ආර්ථික න්‍යායේ පවතින වාසි අනුව ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ හැසිරීම විශ්ලේෂණය කරන්න.

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

**********************